# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 12/2015

අංක. 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2015.09.17

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>පුස්තකාල සහකාර තනතුරු නාමය වෙනස් කිරීම හා දත්ත සැකසුම් ක්‍රියාකරු හා පරිගණක යෙදුම් සහකාර තනතුරුවල අධි ශ්‍රේණිය හා විශේෂ ශ්‍රේණියට අයත් තනතුරු නාම නැවත නම් කිරීම</u>**

උක්ත තනතුරුවලට අදාල බඳවා ගැනීමේ පරිපාටි හා එකී තනතුරුවලට සමාන තනතුරුවල අධි ශ්‍රේණිය නැවත නම් කරමින් නිකුත් කර ඇති 1996.01.24 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 663 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2. කොමිෂන් සභාව, 2015.04.09 හා 2015.07.23 යන දිනයන්හි පැවති සිය 914 හා 921 වැනි රැස්වීම්වල දී පහත සඳහන් තීරණයන්ට එළඹුනි ;

(අ) දත්ත සැකසුම් ක්‍රියාකරු හා පරිගණක යෙදුම් සහකාර තනතුරුවල අධි ශ්‍රේණිය හා විශේෂ ශ්‍රේණියට අදාල තනතුරු නාම පහත පෙන්වා ඇති ආකාරයට නැවත නම් කිරීමට ;

| වැටුප් කේතය | දැනට පවත්නා තනතුර | නව තනතුර |
|---|---|---|
| U-MN 4(II) | දත්ත සැකසුම් ක්‍රියාකරු, අධි ශ්‍රේණිය | මාණ්ඩලික සහකාර/ දත්ත සැකසුම්කරණ |
| | පරිගණක යෙදුම් සහකාර, අධි ශ්‍රේණිය | මාණ්ඩලික සහකාර/ පරිගණක යෙදුම් |
| U-MN 4 (I) | දත්ත සැකසුම් ක්‍රියාකරු, විශේෂ ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර/ දත්ත සැකසුම්කරණ |
| | පරිගණක යෙදුම් සහකාර, විශේෂ ශ්‍රේණිය | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර/ පරිගණක යෙදුම් |

(ආ) පුස්තකාල සහකාර තනතුරු නාමය පහත පරිදි වෙනස් කිරීමට;

| වැටුප් කේතය | දැනට පවත්නා තනතුර | නව තනතුර |
|---|---|---|
| U-MN 1(III A) | පුස්තකාල සහකාර III ශ්‍රේණිය | පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය |
| U-MN 1(II) | පුස්තකාල සහකාර II ශ්‍රේණිය | පුස්තකාල තොරතුරු සහකාර II ශ්‍රේණිය |
| U-MN 1(I) | පුස්තකාල සහකාර I ශ්‍රේණිය | පුස්තකාල තොරතුරු සහකාර I ශ්‍රේණිය |
| U-MN 4(II) | මාණ්ඩලික සහකාර/ පුස්තකාල සේවා | මාණ්ඩලික සහකාර/ පුස්තකාල සේවා |
| U-MN 4(I) | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර/ පුස්තකාල සේවා | ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර/ පුස්තකාල සේවා |

2/-

3. ඉහත තීරණ 2015.09.01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

4. මෙම වෙනස් කිරීම් ඉහත තනතුරුවල බඳවා ගැනීමේ පරිපාටි අවශ්‍යතාවලින්, රාජකාරි ස්වභාවයෙන් හෝ වැටුප්වලින් කිසිදු බැහැර වීමකට හේතු නොවිය යුතු ය.

5. කරුණාකර ඒ අනුව අවශ්‍ය පියවර ගන්න.

මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත්:
1. ලේකම්/ විශ්වවිද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාලවල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාලවල මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මූ/ස.මූ
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තීය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූජීසී/එච්ආර්/2/3/75

T/-